# පොළ ක්‍රමයේ විකාශනය

බාහිර වෙළඳාමේ ක්‍රමික දියුණුවත් සමඟ අභ්‍යන්තර වෙළඳ කටයුතු සුළු වශයෙන් හෝ ආරම්භ වී තිබුණ බවට ප්‍රමාණවත් සාක්ෂි ඓතිහාසික ලිපි ලේඛන ඇසුරින් ලැබී ඇත. අනුරාධපුර යුගයේදී අභ්‍යන්තර වෙළඳ කටයුතු සඳහා මුදල් භාවිතය ආරම්භවී ඇති අතර ඒ වන විටත් භාණ්ඩ හුවමාරු ක්‍රමය බහුලව භාවිතා විය. මෙම භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගැල් යොදාගත් බවට ප්‍රමාණවත් තොරතුරු දැනටමත් ලැබී තිබේ. පැරණි අභ්‍යන්තර පොදු වෙළඳපොළවල්, ජනයා බහුලව එක් රැස්වෙන නාගරික මධ්‍යස්ථාන, ආගමික මධ්‍යස්ථාන සහ නැව් තොටවල් කේන්ද්‍ර කොටගෙන ආරම්භවී තිබුණි. මේවායෙහි බිහිවීමට කාලීනව පැවැත්වූන ජාතික, ආගමික සහ සංස්කෘතික උත්සව මෙන්ම විදේශ වෙළඳ කටයුතුද බලපාන්නට ඇත.

මෙරට පොල ක්‍රමයේ විකාශනය, වෙළඳ ක්‍රමයේ විකාශනයත් සමඟ බැඳී පවතින්නකි. එම නිසා පොල ගැන ඓතිහාසික තොරතුරු විමසීමකදී, මෙරට වෙළඳ ක්‍රමයේ ආරම්භය පිළිබඳ කරුණු බැහැර කළ නොහැක.

මනුෂ්‍ය ජනාවාස බිහිවීමට පෙර, මෙරට විසූ යක්ෂ සහ නාග ගෝත්‍රිකයන් විදේශ වෙළඳුන් සමඟ වෙළඳ භාණ්ඩ හුවමාරු කර ගැනීම්වල යෙදුන බව චීන ජාතික පාහියන් භික්ෂුවගේ දේශාටන වාර්තාවල සඳහන්වේ. එසේම මෙරට මුල් ජනපදිකයන් වූ ඉන්දු ආර්යයන්ද මුලින්ම පැමිණ ඇත්තේ වෙළඳ කටයුතු සඳහායි. විජය කුමරු ඇතුළු පිරිසට කුවේනිය විසින් බත් පිස දෙන ලද්දේ නැව්වලින් ගන්නා ලද සහල් වලින් බව විජය පුරාවෘතයේ සඳහන්ය. මේ අනුව වෙළඳ ක්‍රමයේ ඉතිහාසය ජනාවාස බිහිවීමටත්, පෙර කාලය දක්වාම ගමන් කරන බවත්, "වෙළඳ භාණ්ඩ හුවමාරු" සංකල්පය පැමිණ ඇත්තේ විදේශ වෙළඳාම තුලින් බවත් පැහැදිලිය.

**බණ්ඩාර රත්නායක විසිනි**
**පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී**
**අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය**

බාහිර වෙළඳාමේ ක්‍රමික දියුණුවත් සමඟ අභ්‍යන්තර වෙළඳ කටයුතු සුළු වශයෙන් හෝ ආරම්භ වී තිබුන බවට ප්‍රමාණවත් සාක්ෂි ඓතිහාසික ලිපි ලේඛණ ඇසුරින් ලැබී ඇත. අනුරාධපුර යුගයේදී අභ්‍යන්තර වෙළඳ කටයුතු සඳහා මුදල් භාවිතය ආරම්භවී ඇති අතර ඒ වන විටත් භාණ්ඩ හුවමාරු ක්‍රමය බහුලව භාවිතා විය. මෙම භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගැල් යොදාගත් බවට ප්‍රමානවත් තොරතුරු දැනටමත් ලැබී තිබේ.

පැරණි අභ්‍යන්තර පොදු වෙළඳපොළවල්, ජනයා බහුලව එක් රැස්වෙන නාගරික මධ්‍යස්ථාන, ආගමික මධ්‍යස්ථාන සහ නැව් තොටවල් කේන්ද්‍ර කොටගෙන ආරම්භවී තිබුණි. මේවායෙහි බිහිවීමට කාලීනව පැවැත්වූන ජාතික, ආගමික සහ සංස්කෘතික උත්සව මෙන්ම විදේශ වෙළඳ කටයුතුද බලපාන්නට ඇත. ගැල් මඟින් රට අභ්‍යන්තරයේ තිබූ වෙළඳ ද්‍රව්‍යයන් නැව් තොටවල් දක්වා ප්‍රවාහනය කිරීමක් සිදුවීම, එම ස්ථානවල වෙළඳ මධ්‍යස්ථාන ආරම්භ වීමට ප්‍රධාන හේතුවක් විය හැකිය.

මෙසේ ජනාකීර්ණ මධ්‍යස්ථාන කේන්ද්‍රකොට ගෙන බිහිවූ පොදු වෙළඳපොළවල් ගණනාවක් අනුරාධපුර යුගයේදී දක්නට ලැබුන බවට තොරතුරු ලැබී ඇත. උපතිස්ස ග්‍රාමයේ තිබුණ "අන්තරාපාණ" නම් පොදු වෙළඳපොලක් ගැන දීපවංශයේ සඳහන්ය. ක්‍රි.වර්ෂ හතරවන සියවසේ තිබූ "කළහුමණක" නම් වූ වෙළඳ ආයතනයක් ගැන තෝනිගල සෙල් ලිපිය කියයි. එසේම මහියංගන ප්‍රදේශයේ ක්‍රි.ව.10 වන සියවසේ පැවතුන "හෝපිටිගම" නම්වූ වෙළඳ පොලක් ගැන බදුලු සෙල් ලිපියේ සඳහන් වී ඇත. මෙම වෙළඳ පොලවල්වල වෙළඳ භාණ්ඩ වූයේ

දේශීයව නිෂ්පාදනය වූ එදිනෙදා අවශ්‍ය වන ද්‍රව්‍යයන් බව ඉහත කී සෙල් ලිපි වාර්තා වැඩිදුරටත් පවසයි.

අනුරාධපුර යුගයේදී රට අභ්‍යන්තරයේ සිට ඉඟුරු, ගම්මිරිස් වැනි ද්‍රව්‍ය තොටුපොලවල් කරා ගැල්වලින් ප්‍රවාහනය කර ඇත. එසේම රට අභ්‍යන්තරයේ වාසය කළ ජනතාවට අවශ්‍ය දියලුණු වැනි දේවල්ද මොවුන් විසින්ම ගෙනවිත් දී තිබේ. රට අභ්‍යන්තරයේ නිපදවනු ලැබූ කෘෂිකාර්මික ද්‍රව්‍යයන් බොහෝ විට කාලීනව නිෂ්පාදනය වන ඒවා නිසා ගැල් කණ්ඩායම්වල ප්‍රවාහන කටයුතු ද සිදුවන්නට ඇත්තේ කාලීනවය. එමනිසා මෙම ගැල්කරුවන්ට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමටත්, ඔවුන් ගෙන ආ ද්‍රව්‍ය බෙදා හැරීමටත් රට අභ්‍යන්තරයේ උප නගරවල කාලීනව බිහිවුනු කුඩා වෙළඳ පොලවල් තිබෙන්නට ඇතැයි සිතිය හැක.

**පැරණි වෙළඳ පොලවල් අතරින්, ඒවායේ නීතිරීති, පරිපාලනය, අලෙවි ද්‍රව්‍ය හා වෙළඳ කටයුතු කෙසේ සිදුවීද යන්න ගැන පැහැදිලි පුළුල් විස්තරයක් ඇත්තේ හෝපිටිගම වෙළඳපොල සඳහා පමණි. එයින් මෙම වෙළඳ රටාව ගැන යම් අවබෝධයක් ලැබිය හැකිවන අතර එය කෙතෙක් දුරට වර්තමානයේ පැවැත්වෙන පොලකට නෑකම් කියන්නේද යන්නත් පැහැදිලි කරගත හැක.**

**හෝපිටිගම වෙළඳපොල පරිපාලන කටයුතු උසස් නිලධාරියෙකුට බාරදී තිබුණි. වෙළඳුන්ගෙන් බදු අයකර ගැනීමේ අයිතිය ඔහු සතුවිය. ඒ බව "මෙම හෝපිටිගම වෙළඳපොල ලබාගත් කිසියම් (නිලධාරී) කෙනෙකුගේ සේවකයන් ගමට පැමිණි කල, උපදේශකයන්, වෙළඳ සංස්ථාවේ සාමාජිකයන්, ගමේ වැඩිහිටියන් රැස්ව හිඳ සතලොස පිරිනිවයන් වහන්සේගේ කාලයේ (පැවති) නීති ප්‍රකාර හා පෙර පැවති සිරිත් පරිදිත් අයබදු ගන්නවා හැර නිත්‍යානුකූල නොවන දෙයක් නොකළ යුතුය..." (ලක්දිව සෙල් ලිපි - පිට 214) යන සෙල් ලිපි පාඨයෙන් තහවුරුවේ. හෙතෙම ඒ වෙනුවෙන් රජුට යම් ගෙවීමක්ද කර තිබුණි. එය වර්තමාන පොලේ ටෙන්ඩර් ලබාදීමේක්‍රමයට සමාන තත්ත්වයක් බව සිතිය හැක.**

මෙම වෙළඳපොල "පදිය" නමින් හඳුන්වා තිබුනි. එහි අදහස "වෙළඳපොල" යන්නයි. (පදිය නමින් හැඳින්වුන වෙළඳපොලවල් ගණනාවක් එකල තිබී ඇත.)

හෝපිටිගම වෙළඳපොල තුල "මඩු" ඉදිකර තිබී ඇත. එක් එක් භාණ්ඩ වර්ග අලෙවි කිරීම සඳහා ස්ථාන නියම කර තිබුන අතර එම ස්ථානවලින් පිටත එම භාණ්ඩ වර්ග අලෙවි කිරීම තහනම් විය. එසේම භූමිය තුළ වෙළඳාම් කලයුතු තැන් සහ නොකල යුතු තැන් නියම කර තිබුන බව "**බදු ගතයුතු බඩු නුසුදුසු තැන්වල හිඳ කොටිකිනීමටද, බුලත් පුවක් මණ්ඩපයක තබා විකිණීමද, නුසුදුසු තැනක විකුණනු දුටුවිට රාජකුලිකයන් විසින් ඉවත් කරවීමද.....**"(ලක්දිව සෙල් ලිපි 214 පිට) යන සෙල් ලිපි වැකියෙන් පැහැදිලි වේ.

හෝපිටිගම වෙළඳපොල සැලසුම් සහගතව තිබී ඇති බව මෙයින් පෙනේ. එසේම එක් එක් වෙළඳුන්ට අයත් වූ ස්ථිර අලෙවි ස්ථාන තිබී නැති බවත්, ඔවුන්ට වාසිදායක වන තහනම් වූ ස්ථානවල පවා වෙළඳ කටයුතුවල නිරතවන්නට ඇති බවත් සිතිය හැකිය.

මෙහි වෙළඳ කටයුතු සඳහා පිට පළාත්වලින් පවා භාණ්ඩ ගෙනවිත් ඇත. එසේ ගෙන එන භාණ්ඩ පෙර මඟට ගොස් බා ගැනීම තහනම් විය. ඔවුන් වෙළඳපොල තුළට පැමිණි පසු එම භාණ්ඩ මිලදී ගත යුතුව තිබුණි. මෙහිදී බදු අය කරගත යුතු වූයේ අලෙවි කළ භාණ්ඩ වලට පමණක් විය.

පොලට ගෙන එනු ලබන භාණ්ඩ ඉන් පිටත ස්ථානවලදී ද අලෙවි කිරීමක් සිදුවූ බව මෙයින් පැහැදිලිය. නමුත් එසේ කළ නොහැකි බව දැක්වෙන නීතියක් පනවා තිබුණි. එම භාණ්ඩ අලෙවි කළ යුත්තේ වෙළඳපොල තුළදී පමණක් වූ නිසා, එම පහසුකම් අනිවාර්යයෙන්ම වෙළඳපොල තුළ තිබෙන්නට ඇත. එසේම පසලොස්වක පොහොය දින වෙළඳාම් කරන්නන්ගෙන් මහියංගනය වෙහෙරට තෙල් පතක් ලබාගත් බව එම සෙල් ලිපිය සඳහන් කරයි. එවැනි දිනවල පවා වෙළඳුන් වෙළඳ කටයුතුවල නිරතවී සිටි බවක් ඉන් පැහැදිලිවේ.

මෙම වෙළඳ රටාවන් ගැන අනුරාධපුර යුගයෙන් පසුව ඇති තොරතුරු සීමිතය. එයට හේතුව එකල ඇතිවූ දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා රටේ ආර්ථික හා දේශපාලන ස්වාධිපත්‍යය දුර්වල වී රාජධානි රට අභ්‍යන්තරයට විතැන්වීම විය

හැක. එසේ වුවද උඩරට ප්‍රදේශ හා මුහුදුබඩ ප්‍රදේශ අතර තවලම් මගින් භාණ්ඩ හුවමාරුව සිදුවූ බවට තොරතුරු ලැබී තිබේ. මෙසේ අභ්‍යන්තරයට ගෙන ගිය සහ එහි සිට මුහුදුබඩ ප්‍රදේශවලට ගෙන ආ, ද්‍රව්‍ය බෙදා හැරීමට හෝ එක්රැස් කිරීමට පුරුදු වූ මධ්‍යස්ථාන නොතිබුනා යයි සිතිය නොහැක. තවලම් කටයුතු දිනපතා සිදු නොවන්නට ඇති අතර එවැනි මධ්‍යස්ථානද දිනපතාම ක්‍රියාත්මක නොවන්නට ඇත. නමුත් මෙවැනි තවලම් වලින් බදු ලබා ගන්නා තොටුපොළවල් රට අභ්‍යන්තරයේ පිහිටා තිබුන නිසා සමහර විට එවැනි තැන් කේන්ද්‍ර කොට ගෙන වෙළඳ කටයුතු සිදුවන්නට ඇතැයි සිතිය හැක. කෙසේ වුවත් සොයා ගතහැකි සාක්ෂි දුර්ලභ වුවද අනුරාධපුර යුගයේ පැවති වෙළඳ රටාව පසුව සම්පූර්ණයෙන්ම විනාශ වී යන්නට ඇතැයි සිතිය නොහැක.

ඇත. පොල ක්‍රමයක් නොවුවද කාලීන වෙළඳුන්ගෙන් යුත් ස්ථිර වෙළඳපොල ක්‍රමයක් දිවයිනේ දකුණු සහ නැගෙනහිර වෙරළාසන්න ප්‍රදේශවල 17 වන ශතවර්ෂය වන විටත් ඇතිවී තිබුන බව ජැක්සන් (1977) පවසයි.

"කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ආදී කාලීන වෙළඳ පොලවල් පිළිබඳව අසන්නට ලැබෙන්නේ අධික ජනගහනයෙන් යුත් දකුණේ සහ නැගෙනහිර වෙරළාශ්‍රිත ප්‍රදේශයන් තුලිනි. මෙම සැකය තහවුරු කිරීමට තරම් මා සොයාගත් සාක්ෂි නොමැති වුවද එම ප්‍රදේශවල වෙළඳ පොළවල්වල අතීතය 17 වන ශතවර්ෂයදක්වා දිවයන්නේය. මේ පිළිබඳව මා සොයාගත් පැරණිම සාක්ෂිය වන්නේ 19 වන ශතවර්ෂයේ පරිපාලන වර්තාවන්ය. ඒවායින් පොළ ක්‍රමයක් විස්තර නොකෙරෙයි. නිෂ්පාදකයන් ඉදහිට තම නිෂ්පාදන නාගරිකයන්ට විකිණීම සඳහා ගෙන එන නාගරික වෙළඳපොල

මෙම වෙළඳ රටාවන් ගැන අනුරාධපුර යුගයෙන් පසුව ඇති තොරතුරු සීමිතය. එයට හේතුව එකල ඇතිවූ දකුණු ඉන්දීය ආක්‍රමණ නිසා රටේ ආර්ථික හා දේශපාලන ස්වාධීනත්‍වය දුර්වල වී රාජධානි රට අභ්‍යන්තරයට විතැන්වීම විය හැක. එසේ වුවද උඩරට ප්‍රදේශ හා මුහුදුබඩ ප්‍රදේශ අතර තවලම් මගින් භාණ්ඩ හුවමාරුව සිදුවූ බවට තොරතුරු ලැබී තිබේ. මෙසේ අභ්‍යන්තරයට ගෙන ගිය සහ එහි සිට මුහුදුබඩ ප්‍රදේශවලට ගෙනඑ. ද්‍රව්‍ය බෙදා හැරීමට හෝ එක්රැස් කිරීමට පුරුදු වූ මධ්‍යස්ථාන නොතිබුනා යයි සිතිය නොහැක. තවලම් කටයුතු දිනපතා සිදු නොවන්නට ඇති අතර එවැනි මධ්‍යස්ථානද දිනපතාම ක්‍රියාත්මක නොවන්නට ඇත. නමුත් මෙවැනි තවලම්වලින් බදු ලබා ගන්නා තොටුපොළවල් රට අභ්‍යන්තරයේ පිහිටා තිබුන නිසා සමහර විට එවැනි තැන් කේන්ද්‍ර කොට ගෙන වෙළඳ කටයුතු සිදුවන්නට ඇතැයි සිතිය හැක. කෙසේ වුවත් සොයා ගතහැකි සාක්ෂි දුර්ලභ වුවද අනුරාධපුර යුගයේ පැවති වෙළඳ රටාව පසුව සම්පූර්ණයෙන්ම විනාශ වී යන්නට ඇතැයි සිතිය නොහැක.

ශ්‍රී ලංකාවේ පොල ක්‍රමයේ වර්ධනය හා විකාශනය 19 වන සියවසෙන් පසු සිදුවූ බව ජැක්සන් (1977) පවසයි. රටේ ඇතිවූ දේශපාලන එක්සත්කම වෙළඳ කටයුතු වලට පහසුවක් විය. එසේම ප්‍රවාහන ක්‍රමයේ ව්‍යාප්තිය හා අලෙවි කිරීම සඳහා භාණ්ඩ වැඩියෙන් නිෂ්පාදනය වීම යන කරුණුද මෙයට බලපා ඇති බව හෙතෙම කියයි. එසේම වැවිලි ආර්ථිකයේ වර්ධනයද පොල ක්‍රමයේ වර්ධනයට යම් බලපෑමක් වන්නට ඇත.

සමහර විට පොලක් බිහිවීමට උචිත පරිසරයක් එතෙක් බිහි නොවී තිබීම පොල ක්‍රමයේ බිහිවීම හා විකාශනය ප්‍රමාද වීමට හේතු වන්නට

ප්‍රදේශ ගැන සඳහන් වන අතර මේවා කාලීන වෙළඳුන්ගෙන් යුත් ස්ථිර වෙළඳ පොලවල් බව පෙනී යයි" (ජැක්සන්, 1977).

මෙරටට උරුමවූ වෙළඳ රටාවක් ඈත අතීතයේ සිටම පැවැත ආ බව මෙම තොරතුරු වලින් හෙලිවේ. මෙම වෙළඳ රටාව කෙළින්ම පොලෙහි විකාශනයට සම්බන්ධ වූවා යැයි කිවහැකි සාක්ෂි නොමැත. නමුත් වර්තමාන පොලවල්වල පවතින ලක්ෂණයන් බොහොමයක් පැරණි වෙළඳ රටාව තුළද පැවැත ඇත. එමනිසා පැරණි වෙළඳ රටාව හා වර්තමාන පොලවල් වල බිහිවීම අතර සම්බන්ධයක් නොමැති යැයි කිව නොහැක.